| හඳහන | ධන නිධානය | අද කෝටිපති | ලග්න වාසනාව | මහජන සම්පත | ගොවිසෙත | මෙගා පවර් | සුපිරි ධන සම්පත | අද සම්පත | සුපර් බෝල් | කප්රුක | ශනිදා වාසනාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2025 - 02 - 16<br>දිනුම් වාරය 1058<br>05 06 40 61<br>ලග්නය - මීන | 2025 - 02 - 16<br>දිනුම් වාරය 1779<br>06 21 28 55<br>අක්ෂරය Q | 2025 - 02 - 16<br>දිනුම් වාරය 2549<br>21 33 37 50<br>අක්ෂරය M | 2025 - 02 - 16<br>දිනුම් වාරය 4435<br>06 09 29 61<br>ලග්නය - තුළා | 2025 -02 - 16<br>දිනුම් වාරය 5749<br>1 8 8 4 0 9<br>අක්ෂරය - D | 2025 - 02 - 16<br>දිනුම් වාරය 3991<br>03 08 58 78<br>අක්ෂරය Q | 2025 - 02 - 15<br>දිනුම් වාරය 2097<br>07 16 56 67 71<br>අක්ෂරය P | 2025 - 02 - 16<br>දිනුම් වාරය 457<br>6 8 8 3 3 5<br>අක්ෂරය G | 2025 - 02 - 16<br>දිනුම් වාරය 324<br>8 4 0 9<br>අක්ෂරය D | 2025 - 02 - 16<br>දිනුම් වාරය 2723<br>14 18 32 74<br>අක්ෂරය N | 2025 - 02 - 16<br>දිනුම් වාරය 1899<br>07 10 20 27 52<br>අක්ෂරය P | 2025 - 02 - 16<br>දිනුම් වාරය 4884<br>03 16 62 70<br>අක්ෂරය A |

# අලුත් අවුරුද්දට සහන මිලට
# අත්‍යවශ්‍ය ආහාර මල්ලක්




**● මානසික සෞඛ්‍යය**

නව යොවුන්වියේ පසුවන්නන් අතර සියදිවි නසාගැනීම් පිළිබඳ අවාසනාවන්ත සිදුවීම් රාශියක් අප අත්විඳිමින් සිටිනවා. මෙම ගැටලුවේ බරපතළකම සමාජ ගැටලුවක් ලෙස රජය හඳුනාගෙන තිබෙනවා. එබැවින්, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් සිසුන් සහ නව යොවුන්වියේ පසුවන්නන් සඳහා දැනුවත් කිරීමේ සහ උපදේශන සේවා පුළුල් කිරීම සඳහා මධ්‍ය කාලීන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වසරේ රුපියල් මිලියන 250 ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**● දේශීයව සහායක උපකරණ නිෂ්පාදනය කිරීම**

ආබාධ සහිත පුද්ගලයින් සඳහා සහායක උපකරණ ඉතා වැදගත් වන අතර ඒවා ඔවුන්ගේ ශරීරයේ කොටසක් ලෙස සැලකේ. සියලුම පළාත්වල මෙම උපකරණ දේශීයව නිෂ්පාදනය කිරීමේ පහසුකම් පුළුල් කිරීම සඳහා පුළුල් වැඩසටහනක් අවශ්‍ය බව රජය අවබෝධ කරගෙන තිබෙනවා. එබැවින්, 2025දී මේ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. මුලදී, රාගම රක්තවේදය සහ පුනරුත්ථාපන රෝහලේ සහායක උපකරණ නිෂ්පාදන පහසුකම ජාතික මධ්‍යස්ථානය ලෙස පුළුල් කරනු ලබන අතර අවශ්‍ය පරිදි කලාපීය නිෂ්පාදන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනවා.

**● අලුත් අවුරුදු කාලය තුළ සහන මිලකට අත්‍යවශ්‍ය ආහාර ලබාදීම**

වැඩිවූ ජීවන වියදම අඩු කිරීම සඳහා ආධාරක පියවරක් ලෙස දැරිය හැකි මිලකට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීමට ඉඩ සලසමින් උත්සව සමය සඳහා ආහාර පැකේජයක් ලබාදීමට රජය තීරණය කර තිබෙනවා. ඒ අනුව, ඉදිරි අලුත් අවුරුදු සමයේදී ලංකා සතොස සමාගම හරහා සහල්, ටින් මාළු, පරිප්පු, ලූනු, අර්තාපල් සහ කරවල ඇතුළු වියළි ආහාර සලාකයක් ලබාදීමට යෝජනා කරනවා. මෙම සලාක ලබාදීමේ පිරිවැය වෙනුවෙන් අප රුපියල් මිලියන 1,000ක් ලබා දීමට යෝජනා කරනවා.

**දිවයින පුරා ග්‍රාමීය මාර්ග සංවර්ධනයට රුපියල් මිලියන 3,000ක්**

**දුම්රිය ප්‍රවාහනය නවීකරණයට මිලියන 500ක් වෙන් කෙරේ**

**17. විදෙස්ගත ශ්‍රී ලාංකික ප්‍රජාව**

ශ්‍රී ලංකාවේ විදෙස්ගත ශ්‍රමිකයින්, විදේශ විනිමය ප්‍රේෂණ සහ විදේශ රැකියාවලින් පසුව ඔවුන් ආපසු මවුබිමට ගෙන එන කුසලතා යන දෙඅංශයෙන්ම රටේ සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා. මෙම වැදගත් ශ්‍රී ලාංකික ප්‍රජාව දිරිගැන්වීමේ සහ ත්‍යාග පිරිනැමීමේ ක්‍රම අපි ගවේෂණය කරමින් සිටිනවා. පළමු පියවර වශයෙන්, ශ්‍රී ලංකාවේ විදෙස්ගත ශ්‍රමිකයන් නැවත මෙරටට පැමිණෙන විට ගුවන්තොටුපොළේදී ඔවුන් සඳහා තීරුබදු නිදහස් සීමාව (duty free allowance) වැඩි කිරීමට අප යෝජනා කරනවා. පවතින විකල්ප පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයකින් පසුව දීමනාව සඳහා වන නිර්ණායක සහ පදනම තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබේ.

**18. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ පොලී යෝජනා ක්‍රමයක්**

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ පොලී යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අප යෝජනා කරනවා. මෙම යෝජනා ක්‍රමය යටතේ වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයින් සුදුසුකම් ලබන අතර ඔවුන්ගේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා රුපියල් මිලියන 1ක් දක්වා වසරක ස්ථාවර තැන්පතු සඳහා වෙළෙඳපොළේ පවතින පොලී අනුපාතවලට වඩා සියයට 3ක වාර්ෂික අතිරේක පොලී අනුපාතයක් ලබාදීමට යෝජනා කරනවා. මෙම යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගෙවිය යුතු සියයට 3ක අමතර පොලියට අවශ්‍ය ප්‍රතිපාදන සඳහා රුපියල් මිලියන 15,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. මෙය 2025 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වනු ඇත.

**19. මතින් තොර සමාජයක් බිහි කිරීම**

සමාජයේ විවිධ කොටස්වලට බලපාන, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ගැටලුවක් බවට පත්වී තිබෙනවා. එබැවින්, දඬුවම් කිරීමෙන් එහා ගිය බහුවිධ ක්‍රමවේදයන් ඔස්සේ මත්ද්‍රව්‍යවලින් තොර සමාජයක් ඇති කිරීමේ වැදගත්කම රජය හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව, දැනුවත් කිරීමේ වැඩසටහන්, උපදේශනය ඇතුළු පුනරුත්ථාපන කටයුතු, සමාජ බලගැන්වීම සහ සමාජගත කිරීම සහ නීතිය බලාත්මක කිරීම සඳහා පුළුල් වැඩපිළිවෙළක් සකස් කිරීමට අප යෝජනා කරනවා. ඒ අනුව, මතින් තොර සමාජයක් ඇති කිරීමේ පුළුල් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**20. වරදකරුවන් වූ සිරකරුවන් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන**

දැනට දිවයින පුරා පිහිටි බන්ධනාගාර 37ක සිරකරුවන් 30,000ක් පමණ සිටිනවා. ඔවුන්ගෙන් තුනෙන් එකක් වැරදිකරුවන් වන අතර අනෙක් අය රිමාන්ඩ් සිරකරුවන්. සිරකරුවන් ද මනුෂ්‍යයන්ය යන මතය උල්ලංඝනය කරන බන්ධනාගාරවල තදබදය අධික වීම, ඔවුන්ගේ ජීවන තත්ත්වය පිරිහීමට හේතු වේ.

සිරකරුවන්ගෙන් සියයට 65ක් පමණ ඔවුන්ගේ වැඩ කරන වයසේ එනම් අවුරුදු 40ට අඩු වයස් සීමාවේ උපරිමයට පැමිණ සිටියි. එබැවින්, වෘත්තීය පුහුණු ආයතන සමඟ එක්ව රැකියා කළ හැකි සහ නිසි ඇගැයීමක් ලබා ගත හැකි කුසලතා සංවර්ධනයට අදාළ පාඨමාලා පවත්වා අදාළ වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අප යෝජනා කරනවා. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දැනට වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 100කින් වැඩි කරනවා.

**21. පොදු ප්‍රවාහනය නවීකරණය කිරීම**

කාර්යක්ෂම පොදු ප්‍රවාහන පද්ධතියක් යනු අර්ථවත් ආර්ථික කටයුතු සහ සංචරණය සඳහා මිනිසුන්ගේ ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ තීරණාත්මක අංගයක්. එබැවින් නාගරික සහ තදාසන්න ප්‍රදේශවල වැඩිවන මගී ඉල්ලුමට සරිලන විධියට පවතින පොදු ප්‍රවාහන පද්ධතිය නව තාක්ෂණය සමඟ වැඩිදියුණු කිරීම සහ නව ප්‍රවාහන ක්‍රම හඳුන්වාදීම අත්‍යවශ්‍ය වෙනවා. ඒ අනුව, මහාමාර්ග සහ දුම්රිය යන ප්‍රවාහන පද්ධති දෙකම වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම කාලෝචිත අවශ්‍යතාවයක්.

**● බස් රථ ප්‍රවාහනය නවීකරණය**

පොදු ප්‍රවාහනය වැඩිදියුණු කිරීමේ මූලික පියවරක් ලෙස නවීන සහ සුවපහසු, දියුණු තාක්ෂණයන් සහිත බස් රථ සමූහයක් නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වාදීමට අප කටයුතු කරනවා. ඒ අනුව, කොළඹ නගර ප්‍රදේශය තුළ ප්‍රධාන මාර්ග කොරිඩෝ තුනක් ඔස්සේ මගී ප්‍රවේශය සඳහා පහත් පතුලක් සහිත (low floor buses) සැපපහසු බස් රථ 100ක් යෙදවීමට අපේක්ෂා කරනවා. ඒ සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන්කිරීමට අප යෝජනා කරනවා. මීට අමතරව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මගී ප්‍රවේශයට පහසු, පහත් පතුලක් සහිත බස් රථ 200ක් තම අරමුදල් යොදාගනිමින් සේවයේ යොදවනු ඇති. මෙම බස් රථ මෙට්‍රෝ බස් සමාගම් ලෙස හඳුන්වන අලුතින් ස්ථාපිත කිරීමට අපේක්ෂිත බස් සමාගම් යටතේ ක්‍රියාත්මක වෙනවා. යෝජිත බස් සමාගම් සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය වූ ක්‍රමවේදයක් මත ක්‍රියාත්මක වනු ඇති.

**● දුම්රිය ප්‍රවාහනය නවීකරණය**

දුර බැහැර මෙන්ම නාගරික සහ උප නාගරික ප්‍රදේශවලදී ද දුම්රිය පොදු ප්‍රවාහනය ඉතා වැදගත් වෙනවා. කෙසේ වුවද, මෙම දුම්රියවල දුර්වල තත්ත්වය මගීන්ගේ ආරක්ෂාවට, සුවපහසුවට සහ දුම්රියේ වේගයට සෘණාත්මකව බලපානවා.

තවද රට තුළ නව දුම්රිය මැදිරි අලුත්වැඩියා කිරීම සහ ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කරන අතරම එය කර්මාන්තයක් ලෙස ස්ථාපිත කිරීම වැදගත් වේ.

ඒ අනුව, එහි පළමු පියවර ලෙස දුම්රිය සේවාවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ වැඩිවන මගී ඉල්ලුමට සරිලන පරිදි සේවාවන් සැපයීමට, පැරණි මගී දුම්රිය මැදිරි ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

රට තුළ ඇති නව මගී දුම්රිය අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් නව දුම්රිය මැදිරි ඉදිකිරීම ආරම්භ කිරීමට 2025 වසර සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 250ක් වෙන්කිරීමට අප යෝජනා කරනවා.

කාර්යක්ෂම දුම්රිය සේවාවක් සැපයීම සහ පොදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන කැලණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ලෙන් ඔබ්බට අදියර වශයෙන් දීර්ඝ කිරීමට අප යෝජනා කරනවා. ඊට අදාළ මූලික වැඩකටයුතු ආරම්භ කිරීම සඳහා 2025 අය-වැය තුළින් රුපියල් මිලියන 250ක් වෙන් කරනවා.

ලංගම බස් රථ සහ පෞද්ගලික බස් ක්‍රියාකරුවන් අතර සෑම බස් මාර්ගයකම ඒකාබද්ධ කාලසටහනක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව රජය විසින් පාර්ශ්වකරුවන් සමඟ මනාව සාකච්ඡා කිරීමෙන් පසුව ක්‍රියාත්මක කරනවා. ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් වැදගත් බලපෑම් ඇති කරන මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජය අඛණ්ඩව ආයෝජනය කරනවා.

**● කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා දුම්රිය ප්‍රවාහනය**

අධික පිරිවැය, ප්‍රවාහනයේදී පසු අස්වනු හානිය, මාර්ග තදබදය සහ පාරිසරික ගැටලු හේතුවෙන් මාර්ග ජාලය හරහා කෘෂිකාර්මික භාණ්ඩ ප්‍රවාහනය ප්‍රධාන අභියෝගයක් ලෙස පවතී. මෙයට පිළියමක් ලෙස, කෘෂිකාර්මික නිෂ්පාදන එම නිෂ්පාදන මධ්‍යස්ථානවල සිට ගමනාන්තය දක්වා ඒ සඳහාම විශේෂිත වූ දුම්රිය පාදක ප්‍රවාහනයක් හඳුන්වා දීමට අප යෝජනා කරනවා. නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික කලාපයක් වන තඹුත්තේගම සිට වෙනත් සුදුසු ගමනාන්ත වෙත කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනය කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට යෝජනා කරනවා.

අධ්‍යයනයේ නිර්දේශය මත ගබඩා පහසුකම් සහිත පැටවුම් තටාක ඇතුළත් කරමින් තඹුත්තේගම දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීමට අප සැලසුම් කරනවා. මෙම මූලික කර්තව්‍ය සඳහා සහය දැක්වීමට ශක්‍යතා අධ්‍යයනය සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරනවා.

**● ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ කලක් තිස්සේ පවතින ණය පියවීම**

ශ්‍රී ලංකන් ගුවන් සමාගම ගුවන් මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ප්‍රමුඛතම සේවාවක් ඉටු කරනවා. තවද පසුගිය රජයන් රාජ්‍ය අයිතිය ඉවත් කර පුද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ගත් උත්සාහයන් ද අසාර්ථක වුණා.

මේ අනුව, රජය එම බැංකු සමඟ ගිවිසුමක් අත්සන් කර 2025 වසරේදී ණය ආපසු ගෙවීම සඳහා මිලියන 10,000ක් මෙන්ම පොලී ගෙවීමට රුපියල් මිලියන 10,000ක් වැය කිරීමට නියමිතය. කලක් තිස්සේ පවතින මෙම ණය සේවා පිරිවැය රජය විසින් පියවාගත් පසු මෙහෙයුම් ලාභදායිත්වය සහතික කිරීම සඳහා ගුවන් සමාගම සම්පූර්ණ වගකීම දරනු ඇත. මේ සඳහා සමාගම විසින් නව මධ්‍ය කාලීන උපාය මාර්ගික සැලැස්මක් සකස් කරමින් සිටී. ඒ අනුව මේ සඳහා රුපියල් මිලියන 20,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**● මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම**

ශක්තිමත් මාර්ග ජාලයක් යනු පුරවැසියන්, වෙළෙඳපොළ සහ පොදු ජනතාව සේවය ලබාගන්නා ස්ථාන සමඟ සම්බන්ධ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම්වල තීරණාත්මක අංගයක්.

ඒ අනුව දිවයින පුරා ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා දැනටමත් වෙන් කර ඇති රුපියල් මිලියන 26,680ට අමතරව, ඌන සංවර්ධිත ග්‍රාමීය ගම්මාන, සංචාරක ගමනාන්ත, කර්මාන්තපුර සහ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන/ප්‍රදේශ සම්බන්ධ කරන මාර්ග සඳහා ප්‍රමුඛත්වය දෙමින් ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

සියලුම ජනතාවට ආරක්ෂිත සහ විශ්වාසනීය ගමනාගමනයක් සහතික කිරීම අරමුණු කර ගනිමින්, ග්‍රාමීය පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**● උතුරු පළාතේ ග්‍රාමීය මාර්ග සහ පාලම්**

උතුරු පළාත ප්‍රධාන සංවර්ධන ක්‍රියාවලියෙන් බොහෝදුරට හුදකලා වී ඇති බව නිරීක්ෂණය වී තිබෙනවා. කෙසේ වෙතත්, එම පළාතෙත් අපගේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට විශාල හැකියාවක් පවතිනවා.

ඒ නිසා මූලික යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් උතුරු පළාතේ ග්‍රාමීය මාර්ග සහ පාලම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**● මුලතිව් වඩ්ඩුවාකල් පාලම ඉදිකිරීම**

වඩ්ඩුවාකල් මුහුදු මාර්ගය මුලතිව්, පුදුකුඩිරිප්පු සහ යාපනය යා කරන ප්‍රධාන මාර්ගය වන මුලතිව් නන්දිකඩාල් කලපුවේ ද්වාරය හරහා පටු පාලමක් තිබෙනවා.

මෙම පාලම අබලන් තත්ත්වයක පවතින බැවින් මගී ජනතාව දැඩි අවදානමකට ලක්ව තිබෙනවා. ඒ නිසා මුලතිව් දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතාවලට සමගාමීව වඩ්ඩුවාකල් පාලම ඉදිකිරීමට අප යෝජනා කරනවා. ඒ අනුව, මේ සම්බන්ධ වැඩ ආරම්භ කිරීමට මෙවර අය-වැය යටතේ රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**22. ප්‍රාදේශීය සංවර්ධනය**

නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීම කෙරෙහි අවධානය යොමු කරමින් විමධ්‍යගත අය-වැය වැඩසටහන 2025 වසරේ ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා එක් මන්ත්‍රීවරයෙකුට 2025 වසර සඳහා රුපියල් මිලියන 10ක් වෙන් කර ඇති අතර, ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා දැනටමත් වෙන් කර ඇති රුපියල් මිලියන 11,250ක අය-වැය ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 2,250ක් මේ සඳහා යොදා ගන්නවා.

ඉතිරි අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 9,000ක් වෙන් කරනු ලබනවා.

**23. දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන**

අප දන්නා පරිදි රජය විසින් වාර්ෂිකව අය-වැය මඟින් විවිධ වැඩසටහන් සඳහා විශාල ආයෝජනයක් සිදු කළ ද දිස්ත්‍රික්ක රැසක පිළිතුරු නොමැති ප්‍රශ්න තිබෙනවා. මෙම විශේෂිත ගැටලු යටිතල පහසුකම් සංවර්ධනය, දේශීය නිෂ්පාදන වැඩිදියුණු කිරීම, එලදායී සේවා සැපයීම, වෙළඳාම සහ අලෙවිකරණය, ආයතනික සංවර්ධනය කිරීම් යනාදිය සම්බන්ධව විය හැකිය. සියල්ල ඇතුළත් සහ තිරසර සංවර්ධනයක් කරා ළඟා වීමට නම්, දිස්ත්‍රික්කවල අවධානය යොමු නොවූ සහ නැඟී එන අවශ්‍යතාවලට විසඳුම් අවශ්‍ය වෙනවා. මෙමඟින් පුද්ගලික අංශය ආර්ථික සංවර්ධනය සඳහා ආයෝජන ගෙන ඒම සඳහා උත්ප්‍රේරකයක් වන අතර මෙමඟින් දේශීය ප්‍රජාවට ඔවුන්ගේ ජීවනෝපාය යහපත් ලෙස ඉහළ නැංවීමට ද හැකියාව ලැබේ. මෙම සන්දර්භය තුළ, දිස්ත්‍රික් මට්ටමින් මතුවන ගැටලු විසඳීම සඳහා 2025 වසරේ අය-වැයෙන් රුපියල් මිලියන 2,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**24. නැඟෙනහිර පළාත සංවර්ධනය**

නැඟෙනහිර පළාත ආර්ථික සංවර්ධනය සඳහා විශාල විභවතාවයක් ඇති පළාත්වලින් එකකි. එබැවින්, අධ්‍යාපනය, සෞඛ්‍ය, කෘෂිකර්මය, ධීවර, සංචාරක සහ ප්‍රජා සවිබල ගැන්වීම් යන ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධනයට සහාය වීම සඳහා ඉන්දියානු බහු-ආංශික ප්‍රදාන ආධාර සමඟ නැඟෙනහිර පළාතේ පුළුල් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අප යෝජනා කරනවා.

**25. "මලයගම්" දෙමළ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ වැඩසටහන්**

"මලයගම්" ජනතාව ශ්‍රී ලාංකීය ජාතියේ කොටසක් වන අතර ඔවුන් දීර්ඝ කාලයක් තිස්සේ සැලකිය යුතු දුෂ්කරතා මැද ජීවත් වෙනවා. කෙසේ වෙතත්, මෙම ප්‍රජාවගේ ජීවනෝපාය තවමත් ගෞරවනීය ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට වඩා පහළින් පවතින්නේ. ඒ අනුව, පහත සඳහන් මුලපිරීම් සඳහා දැනටමත් රුපියල් මිලියන 7,583ක් අය-වැය තුළ වෙන් කර තිබෙනවා.

i. වතු නිවාස සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 4,267 ක් වෙන් කර තිබෙනවා.

ii. "මලයගම්" දෙමළ තරුණයින්ගේ වෘත්තීය පුහුණුව, ජීවනෝපාය සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 2,450ක් වෙන් කර තිබෙනවා.

iii. "මලයගම්" දෙමළ ප්‍රජාවේ පාසල් සඳහා නවීන/සුහුරු පන්ති කාමර සඳහා රුපියල් මිලියන 866ක් කර තිබෙනවා.



**පොදු ප්‍රවාහනය වැඩිදියුණු කිරීමේ මූලික පියවරක් ලෙස නවීන සහ සුවපහසු, දියුණු තාක්ෂණයන් සහිත බස් රථ සමූහයක්**

**26. කාර්මික සංවර්ධනය**

ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය, රටෙහි ආර්ථිකයේ ප්‍රධාන වශයෙන් රැකියා අවස්ථා සැපයීම, ආදායම් වැඩි කිරීම, නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සහ අපනයන ප්‍රවර්ධනය සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, පහත යෝජනා ඉදිරිපත් කරනවා.

ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් ඇති ඛනිජ සම්පත්වල අගය එකතු කිරීම වැඩිදියුණු කිරීමට සහ දේශීය නිෂ්පාදන සඳහා අත්‍යවශ්‍ය කාර්මික යෙදවුම් සැපයීමේ අරමුණින්, අම්ල සහ ක්ෂාර ඇතුළු රසායනික නිෂ්පාදන සඳහා වෙන් වූ කාර්මික කලාපයක් පරන්තන්හි පිහිටුවීමට යෝජනා කරනවා. තවද, කන්කසන්තුරේ, මාන්කුලම්, ඉරණවිල, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල සහ ගාල්ල යන ප්‍රදේශවල ආරම්භ කර අඩාළ වී ඇති කාර්මික කලාප, කාර්මික උද්‍යාන (techno park) සංවර්ධනය කරනු ලැබේ. මේ සඳහා, රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**● මෝටර් රථ සහ රබර් නිෂ්පාදනය සඳහාම වෙන් වූ කාර්මික කලාපය**

උපාංග නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය වශයෙන් අගය එකතු කළ මෝටර් රථ නිෂ්පාදන/එකලස් කිරීමේ කර්මාන්තය සහ රබර් නිෂ්පාදනය සඳහා සැලකිය යුතු මට්ටමේ ආයෝජනයක් අපනයන වෙළඳපොළේ තරගකාරී වීම සඳහා අවශ්‍ය වනවා.

මෙම අරමුණින්, මෝටර් රථ උපාංග සහ රබර් නිෂ්පාදනය සඳහා කැප වූ කාර්මික ජනපදයක් ස්ථාපිත කිරීමට අප යෝජනා කරනවා. කර්මාන්ත අමාත්‍යාංශය යටතේ දැනටමත් වෙන් කර ඇති රුපියල් මිලියන 1,500ක අය-වැය ප්‍රතිපාදන තුළ මෙම අවශ්‍යතාවය කළමනාකරණය කිරීමට අප යෝජනා කරනවා.

**27. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන**

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන ශ්‍රී ලංකාව සහ සමස්ත ශ්‍රී ලාංකීය සමාජය ඉහළ මට්ටමකට තිරසරව ඔසවා තැබීම සඳහා සමාජයීය සංවර්ධනය, පාරිසරික සංවර්ධනය සහ ආචාර ධර්ම සංවර්ධනය යන ප්‍රධාන කුලුනු තුන ඔස්සේ ක්‍රියාත්මක කරන දැවැන්ත වැඩසටහනකි. මේ සඳහා සමස්ත මහජනතාව, රාජ්‍ය යන්ත්‍රණය, ව්‍යවසායකයින්, ව්‍යාපාරිකයින් ඇතුළු පෞද්ගලික අංශය, ජාතික සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව, ජාත්‍යන්තර ආධාර දෙන ආයතන, විවිධ වෘත්තිකයින් විශේෂඥයන් ඇතුළු සියලු දෙනාගේ සහයෝගය ලබා ගැනීමට සැලසුම් කර ක්‍රියාත්මක කරමින් පවතී.

මේ යටතේ, ශ්‍රී ලාංකික සමාජයේ විවිධ ජාතීන් අතර, විවිධ ආගම් අතර, විවිධ වූ ජන කොටස් අතර සබැඳියාව, අන්නෝන්‍ය අවබෝධය සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කරමින් සියලු ජන කොටස්වලට එක්ව සතුටු විය හැකි සංස්කෘතික උලෙළක් පැවැත්වීම, අප රටේ ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් වන වෙනස් හැකියාවන් පවතින කොටස් සඳහා පහසුකම් නිර්මාණය කිරීම, සංචාරක ව්‍යාපාරය සඳහා ත්‍රීවීල්, ටැක්සි රියදුරන් සහ සංචාරක මඟ පෙන්වන්නන් වැනි පහසුකම් සපයන්නන්ගේ ආචාරධර්ම ප්‍රවර්ධනය සහ ධාරිතා වර්ධනය, පෞරාණික උරුමයන් සහිත තෝරාගත් නගර කිහිපයක් පෞරාණික අනන්‍යතාවය සහිතව ප්‍රතිනිර්මාණය කිරීම, අඩු පහසුකම් සහිත තොරාගත් පළාත් පාසල් සඳහා ගොඩනැඟිලි අලුත්වැඩියාව, පාසල් උපකරණ අලුත්වැඩියාව, සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම, පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයේද දායකත්වයෙන් ඉහළ ප්‍රමිතියෙන් යුතු අධ්‍යයන පරිසරයක් ගොඩනැඟීම, නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය, ආහාරපානවල පිරිසිදුභාවය තහවුරු කිරීම, මාර්ග ආරක්ෂාව ප්‍රවර්ධනය, මත්ද්‍රව්‍ය නිවාරණය, අයාලේ යන වීදි සතුන් කළමනාකරණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, වෙරළ තීරය ආකර්ෂණීය සහ පාරිසරිකව තිරසර ලෙස නිර්මාණය කිරීම, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සහ ගංගාවල ජලයේ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම, ඉහළ සම්පත් උපයෝගීතාවයක් ඇති කිරීම සහ සුපිළිපන් රාජ්‍ය සේවයක් ගොඩනැඟීම සහ ක්ලීන් ශ්‍රී ලංකා සංකල්පය ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය සිදු කිරීමට අපේක්ෂිතය.

මේ සඳහා සහයෝගය ලබා දෙන්නන්ගේ මූල්‍යමය දායකත්වයට අමතර වශයෙන් 2025 වර්ෂයේ රාජ්‍ය අය වැය මඟින් රුපියල් මිලියන 5000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

**28. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

රටේ බොහෝ ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ඉහළ යමින් පවතින ගැටලුවක්. සැලකිය යුතු ඓතිහාසික හා සංස්කෘතික වටිනාකමක් ඇති නගරයක් වන අනුරාධපුරයේ පවත්නා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුව එවැනි එක් උදාහරණයකි. වැඩි වන ජනගහනයත් සමඟ අනුරාධපුර ශික්ෂණ රෝහලේ සහ සාමාන්‍ය රෝහල්හි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම අභියෝගයක් වී ඇති අතර, එය මහජන සෞඛ්‍යයට සහ පරිසරයට ද තර්ජනයක් වී ඇත. මෙයට මුහුණ දීම සඳහා, අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් සඳහා රුපියල් මිලියන 750 ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. මෙම මූලාරම්භයන් අනුරාධපුර නගරයේ පවිත්‍රතාව ඉහළ නැංවීම, පරිසරය ආරක්ෂා කිරීම සහ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වනු ඇති.

11 පිටුවට